# මහජන අවධානය පිණිසයි...



රාත්‍රී 11.00 ට පමණ මීගමුව කුඩා පාඩුවේ කුරුස මාවතේ පදිංචි විසිනව (29) හැවිරිදි වර්ණකුලසූරියගේ නිමල් ගේ නිවස අසලට සුදු පැහැති වෑන් රථයකින් පැමිණි ආයුධ සන්නද්ධ පිරිසක් තම ඥාතීන් බිය ගන්වා බලහත්කාරයෙන් නිමල්ව පැහැරගෙන යන ලදී. පවුලේ උදවිය හා හිත මිතුරන් පොලිසියට හා ප්‍රදේශයේ දේශපාලන බලවතුන්ටද එදින රාත්‍රියේම සිද්ධිය පැමිණිලි කළහ. පසුද පාන්දර 5.00 ට පමණ නිමල් ගේ නිවසට පණිවිඩයක් ලැබුනු අතර එයින් කියවුනේ කටාන ප්‍රදේශයේ පාලු ස්ථානයක දමා ඇති මළ සිරුරක් පිළිබඳවයි. එහි ගිය ඥාතීන්ට දක්නට ලැබුනේ ඒ වනවිටත් උණුසුමවත් නොගිය නිමල් ගේ මළ සිරුරයි. ඒ 2006 ඔක්තෝබර් 07 වනදය.

කටුනායක නිදහස් වෙළඳකලාපයේ පිහිටි ෆ්ලෝරල් ග්‍රීන්ස් ආයතනයේ සේවය කළ එච්. එම්. රංජිත් ආයතනයේ පැවැති විනය පරීක්ෂණයකට සහභාගී වී ඔහුගේ නීති උපදේශක ලයනල් සමඟ සවස 7.00 ට පමණ පා පැදියෙන් ආපසු යමින් සිටියදී කොළ පාට ජීප් රථයකින් පැමිණි පිරිසක් ඔවුන් බලහත්කාරයෙන් පැහැරගෙන යන ලදී. මේ සම්බන්ධව පොලිසියට හා ප්‍රදේශයේ දේශපාලන බලවතුන්ට දැන්වුවත් ඔවුන් පිළිබඳ කිසිඳු තොරතුරක් සොයා ගැනීමට නොහැකි විය. පසුදින පාන්දර ඔවුන්ගේ නිවසට පණිවුඩයක් ලැබුනු අතර, එයින් කියවුනේ බාගෙට පිළිස්සුනු සිරුරු දෙකක් සීදුව රද්දොළුව හන්දියේ දමා ඇති බවයි. එහි ගිය ඥාතීන්ට දැක ගත හැකි වූයේ පිළිස්සී හදුනා ගැනීමට නොහැකි මළ සිරුරු දෙකකි. පසුව රංජිත් පැළඳ සිටි සපත්තුවක් නිසා එම මළසිරුරු රංජිත්ගේ හා ලයනල්ගේ බව ඥාතීන් විසින් හදුනා ගන්නා ලදී.. ඒ දිනය 1987 ඔක්තෝබර් 27 වනදා විය.

මෙම සිදුවීම් දෙක අතර කාල පරාසය අවුරුදු 20 කි. දෙවැනි සිදුවීම වූ අවධියේ දී මේ ආකාරයෙන් තවත් එවැනි සිදුවීම් රාශියක් දකුණු පලාතේ සිදුවීය. රජයේ නිල සංඛ්‍යාලේඛන අනුව එය 30,000 ක් වූ අතර නොනිල සංඛ්‍යාලේඛන වලින් කියා සිටියේ එම ප්‍රමාණය 60,000 ක් බවයි.

එදා ඒ මහා ව්‍යවසනයට එරෙහිව විවිධ සංවිධාන ගොඩ නැගුණි, විපක්ෂයේ සිටි දේශපාලනඥයින් මෙම කාරණාව මත සිට එදා සිටි ආණ්ඩු පක්ෂය පතුරු ගසනා ලදී. තමුන්ගේ රජයන් යටතේ මෙවැනි විනාශයන් සිදුවීමට ඉඩ නොතබන බව සපථ කර, එදා භීෂණයට එරෙහිව ''පාද යාත්‍රා'', ''ජන ඝෝෂා'' පැවැත්වූහ. ඉන් නොනැවතී මේ අවනඩුව ජාත්‍යන්තර සංවිධාන වෙත පැමිණිලි කරන්නට ගොස් එදා පැවැති ආණ්ඩුවේ මර්දනයට ද හසුවිය. එම බලවේගයන් මත ගොඩනැගුන ජනතා ව්‍යාපාරය නිසා පැවැති රජයන් පෙරලා දැමීමටද ඉන් හැකි විය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවක් යටතේ මවු පෙරමුණක් අවශ්‍ය වේදැයි 1992 සැප්තැම්බර් 6 වැනිදා ලක්දිව පුවත්පත සමඟ සාකච්ඡාවක යෙදුනු එදා විපක්ෂයේ සිටි මහින්ද රාජපක්ෂ මන්ත්‍රීවරයාගෙන් විමසූවිට ඔහු පැවසුවේ ''ඇත්ත වශයෙන්ම මීළඟ ශ්‍රී.ල.නි.ප. ආණ්ඩුවක් යටතේ මෙවැනි අපරාධ ඇතිවීමට අප ඉඩ තියන්නේ නැති බවත්, එවැනි ශ්‍රී.ල.නි.ප. යක් තුළ අපි මොහොතක් හෝ රැඳෙන්නේ නැති බවට සහතික වෙන බවයි'' ඒ මහින්ද රාජපක්ෂ දැන් රටේ ජනාධිපතිවරයාය. ඒ පුවත්පත් සාකච්ඡාව කළ මාධ්‍යවේදී ඩලස් අලහප්පෙරුම දැන් ජනාධිපති උපදේශකයෙක් හා රජයේ ප්‍රබල ඇමතිවරයෙකි.

එදා මර්ධනය ගැන සොයා බලන්න කොමිසම් පත්කළ අතර, එම කොමිසම් මඟින් අතුරුදහන්වූවන් වෙනුවෙන් විවිධ නිර්දේශ යෝජනා කර තිබුනි. වැරදිකරුවන්ට නඩු

පැවරීමට කටයුතු කරන ලෙසද නැවත එවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදුකරන ලෙසද ඒ මඟින් නිර්දේශ කර තිබුනි.

පසුගිය අවුරුදු 20 තුළ ඉන් කරුණු එකක් දෙකක් හැරෙන්නට අන් කිසිවක් කිරීම, ඉන් පසු බලයට පැමිණි රජයන් විසින් පැහැර හරින ලදී. 1989 න් පසු උතුරු නැගෙනහිර පමණක් ක්‍රියාත්මක වූ පැහැරගෙන යාම් 2006 වන විට නැවතත් දකුණ වෙත ගමන් කරමින් තිබුනි. නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උප කුලපති එස්. රවීන්ද්‍රනාත් මහතා 2006 දෙසැම්බර් 15 වන දින කොළඹ 07 අධිආරක්ෂක කලාපයේ පිහිටි විද්‍යාභිවර්ධන සංගමයේ දේශණයකට සහභාගී වී ශාලාවෙන් එළියට පැමිණෙන විටදී අතුරුදහන් විය. මේ වන විට එසේ අතුරුදහන්වූවන්ගේ ප්‍රමාණය 2400 ක් බව අතුරුදහන්වූවන් පිළිබඳව සොයා බැලීම් කමිටුව පවසයි.

1971, 1980, 1983, 1987/89 භීෂණ යුගය වැනි බිහිසුණු මිලේච්ඡ අත්දැකීම් රාශියකට මුහුණ දුන් රටක්, පෙරටත් වඩා බරපතල ආකාරයෙන් අතීතයේ සිදුවීම් නැවත නැවතත් සිදුවෙන්නට ඉඩ දෙන්නේ ඇයි.? වාමාංශික යැයි කියා ගන්නා මන්ත්‍රීවරු 50 කට ආසන්න නියෝජනත්වයක් තිබෙන පාර්ලිමේන්තුවක මෙවැනි දේ වැලැක්වීමට හරවත් උත්සාහයක් නොගැනෙන්නේ ඇයි.? ඒ කෙසේ වුවත් මෙවැනි බරපතල තත්ත්වයක් තම ඇස් ඉදිරිපිට දිග හැරෙද්දී ඊට එරෙහිව රටේ මහජනතාව විසින් ශක්තිමත් හඬක් නොනැගන්නේ ඇයි.? මෙතරම් බරපතල සිදුවීම් දිග හැරෙද්දි මෙතරම් නිහඬතාවක් රටතුළ පවතින්නේ ඇයි..?

'අයුක්තියට එරෙහිව අප සටන් කළ යුත්තේ අපේම මනුෂ්‍යත්වය ආරක්ෂා කර ගැනීම පිණිසයි'' යැයි නෙල්සන් මැන්ඩලා වරෙක කියා තිබේ. ඉතිහාසයේ වරක් සිදුවූ දෙය නැවත වරක් සිදුවන්නට ඉඩ දී රටේ මහජනයා උඩ බලන් සිටියහොත්, එය පෙරට වඩා විශාල ලෙස හා වේගවත් ලෙස නැවත සිදුවීමට ලබා දෙන නිහඬ අනුමැතියක් වනු ඇත. එය එසේම වූ බව, අපගේ අතීත අත්දැකීම් අපට මතක්කර දේ. තවදුරටත් සමාජයේ ඇති වී තිබෙන මෙම බරපතල හිස්කම හා නිහඬතාවය තහවුරු වෙන්නට ඉඩ දී බලා සිටියහොත්, ඒ මහා ව්‍යවසනයේ දී ඔබ වෙනුවෙන් කතා කිරීමට කිසිවෙකු ඉතිරි නොවනු ඇත.

**ප්‍රථමයෙන් මේ ගැන ඔබම කල්පනා කරන්න,**
**අපි මේ කියන කථාවට ඔබත් එකඟද..? වෙනත් යෝජනා තිබේද..?**
**මේ සම්බන්ධව මෙතෙක් ඔබ ගෙන ඇති ක්‍රියා මාර්ග නිවැරදිද.?**
**මේ ගැන ඔබට වෙනත් කරන්න කිසිම දෙයක් නැද්ද..?**
**ඔහොමම ඉන්න ගමන් කැමතිද පොඩි වෙනස් කමක් කරන්න එක්වෙන්න...**

අපි, 1990 සිටම මෙවැනි විනාශයන් නැවත නැවතත් සිදුවීම වලක්වා ගන්න උත්සාහ ගන්නා පුංචි කණ්ඩායමක්, 1992 මෙහි ඉහත සඳහන් රංජිත් හා ලයනල් මරා දැමූ ස්ථානයේ ඔවුන් ඇතුළු එසේ මරා දැමූ සියළුම දෙනා සිහිකරමින් ආගමික උත්සව හා උද්ඝෝෂණ පවත්වමින් පැමිණ, 2000 වර්ෂයේ දී එම ස්ථානයේ ශ්‍රී ලංකාවේ අතුරුදහන්කරනු ලැබූ සියළු දෙනා සිහිකිරීම පිණිස 'අතුරුදහන්වූවන්ගේ ස්මාරකයක්' ගොඩනගමින් මෙම විෂය කවුරුත් කතා කිරීම අත්හැර තිබෙන මොහොතක අත්නොහැර ඒ වෙනුවෙන් කථාකරන හා පෙනී සිටින කණ්ඩායමක්.

**1** **නැවතත් සිදුවෙමින් පවතින අතුරුදහන්කරවීම් වැලැක්වීමට බලපෑම් කිරීම,**
**2** **අතුරුදහන්කරවීම් අපරාධයක් ලෙස නීතිගත කරවා ගැනීම,**
**3** **අතුරුදහන්කරවීම් වලින් පුද්ගලයන් ආරක්ෂා කරගැනීමේ ජාත්‍යන්තර ප්‍රඥප්තියට ශ්‍රී ලංකාවත් පංගුකාරයන් කරවීම,**
**4** **අපරාධයන්ට එරෙහි සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම හා අපරාධ නඩු විභාගය වේගවත් කිරීම,**
**5** **රජයේ ආයතන හා නිළධාරීන් විසින් සිදුකරන මානව හිමිකම් කඩවීම් වලට එරෙහිව මහජනයා දැනුවත් කිරීම හා එවැනි ක්‍රියාමාර්ගයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ගයන් වෙත ඔවුන් යොමුකිරීම,**
**6** **අතුරුදහන්වූවන්ගේ පවුල්වලට ලබාදීමට නිර්දේශිත සහන වහා ලබා දෙන ලෙස ඉල්ලීම,**
**7** **අතුරුදහන්වූවන්ගේ පවුල්වෙත සහන සැලසීම සඳහා රජය විසින් 'භාරයක්' පිහිටුවීමට ඉල්ලීම,**

යන කාරණා මත පදනම්ව ගම්පහ, ගාල්ල, කළුතර, නුවර, පුත්තලම, මාතර, හම්බන්තොට යන දිස්ත්‍රික්කයන් තුළ අප සංවිධාන ක්‍රියාත්මක වේ.

**අතුරුදහන්වූවන් සිහිකර 17 වන වරට පැවැත්වෙන 'ඔක්තෝබර් උත්සවය' මෙවරත්**
**ඔක්තෝබර් 27 උදේ 9.00 සිට 12.00 දක්වා සීදුව රද්දොළුව හන්දියේ**
**'අතුරුදහන්වූන්ගේ ස්මාරකය' අසලදීපැවැත්වේ.**
**ඊට සහභාගී වන ලෙසද ඔබට මින් ආරාධනය කර සිටිමු.**

මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු දැනගැනීමට ඔබත් කැමති නම්, අපට ලියන්න කථා කරන්න

**අතුරුදහන්වූවන්ගේ පවුල් එකතුව,**
**Right to Life මානව හිමිකම් මධ්‍යස්ථානය**
555, කොළඹ පාර, කටුනායක - දුරකතන 0314 870308